සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூகவலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

# දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
# வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
# Department of Divineguma Development

1වනඅධියර, 4 වන මහල ,සෙත්සිරිපාය ,බත්තරමුල්ල.
1ம் கட்டம்,4வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல
1stStage , 4th floor, **Sethsiripaya ,Battaramulla**

මගේ අංකය
எனதுஇல
My No } DDD/HO/07/SD/08/1/SDEP

ඔබේ අංකය
உமது இல
Your No } ..............................

දිනය
திகதி
Date } 2017.02.22

දිවිනැගුම චක්‍රලේඛ අංක 2017/04

සියලුම දිස්ත්‍රික් ලේකම් /දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියලුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්,

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

## <u>දිවිනැගුම සමාජ සංවර්ධන හා පරිසර වැඩසටහන</u>

දිවිනැගුම සංවර්ධන වැඩසටහනට අනුගත වෙමින් අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ ජීවන මට්ටම සමාජීය වශයෙන් ඉහළ නැංවීම, සාරධර්ම වලින් පිරි යහපත් සමාජයක් නිර්මාණය කිරීම හා සුරක්ෂිත පරිසරයක් ඇති කිරීම උදෙසා නව දැක්මක් යටතේ සමාජ සංවර්ධන හා පරිසර වැඩසටහන ක්‍රියාත්මක කිරීමට 2017 වර්ෂයේ දී අපේක්ෂා කෙරේ.

02. ඒ අනුව අතිගරු ජනාධිපතිතුමා විසින් දිළිඳුකම පිටුදැකීමේ වර්ෂය ලෙස 2017 වර්ෂය ප්‍රකාශයට පත් කිරීම හා තිරසර සංවර්ධන වැඩසටහනට සමගාමීව දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් **සමෘද්ධි සහනාධාර ලබන පවුල් සවිබල ගැන්වීමේ වැඩසටහන** සම්බන්ධයෙන් ඔබ වෙත යොමුකර ඇති DDD/HO/04/Action Plan-2017 දරණ 2017.01.17 හා 2017.01.25 දිනැති ලිපි කෙරෙහි අවධානය යොමු කරවමි. එකී ලිපි අනුව අපේක්ෂිත පරිදි පවුල් 125,000 ක් සවිබල ගැන්වීම සඳහා **ඇමුණුම් අංක 01** හි සඳහන් වන සමාජ සංවර්ධන හා පරිසර වැඩසටහන් 2017 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළයුතු අතර ඒ සඳහා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන වලට අමතරව සමාජ සංවර්ධන පදනම සතු අරමුදල් යොදවාගත යුතුවේ.

03. තව ද 2016/06 චක්‍රලේඛයේ සඳහන් සීමාවන් අනුව ඉදිරියටත් කටයුතු කළ යුතු අතර සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම හා දිස්ත්‍රික් කාර්යාලයකම සමාජ සංවර්ධන පදනම සතු අරමුදලින් 2017 වසරේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් සැලැස්ම ඇමුණුම් අංක 02 අනුව දැනගැනීම සඳහා 2017.03.15 දිනට පෙර ප්‍රධාන කාර්යාලයට එවිය යුතුවේ.


| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂජනරාල් / மேலதிகபணிப்பாளர்தலைமையதிபதி / Additional DirectorGeneral | අධ්‍යක්ෂ(පාලන) / பணிப்பாளர்(நிர்வாகம்) / Director (Administration) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|
| Tel- | 2-011873802/2872202 | 011-2871672 | 011-2873799 | 011-2887280 |
| Fax - | 2-011889002 | 011-2887280 | 011-2873996 | **011- 2887722(Hotline)** |
| E-mail- | dg@divineguma.gov.lk | adg@divineguma.gov.lk | diradmin@divineguma.gov.lk | |

03.සියලු සමාජ සංවර්ධන හා පරිසර වැඩසටහන්වල ප්‍රගතිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් ලබාගෙන, සාරාංශය දිස්ත්‍රික් කාර්යාලය මගින් ඇමුණුම් අංක 03,04 අනුව සෑම මසකම 05 වන දිනට ප්‍රථම ප්‍රධාන කාර්යාලය වෙත යොමු කරන ලෙස අදාල නිළධාරින් දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වමි.

04. මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් වැඩි විස්තර 0112-889005, 0112-876601 දුරකථන අංක මගින් හෝ socialdev@divineguma.gov.lk විද්‍යුත් තැපැල් ලිපිනය මගින් සමාජ සංවර්ධන අංශය අමතන්නේ නම් මැනවි.

නීල් බණ්ඩාර හපුහින්න
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත :-

1. සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍ය ගරු එස්.බි. දිසානායක මැතිතුමා - කා. දැ.ගැ.ස.
2. සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන නියෝජ්‍ය අමාත්‍ය ගරු රන්ජන් රාමනායක මැතිතුමා - කා. දැ.ගැ.ස.
3. ලේකම්, සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය - කා. දැ.ගැ.ස.
4. අතිරේක ලේකම්(දිවිනැගුම), සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය - කා. දැ.ගැ.ස.
5. රජයේ විගණන නිළධාරි, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා. දැ.ගැ.ස.
6. ප්‍රධාන ගණකාධිකාරි, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා. දැ.ගැ.ස.
7. ප්‍රධාන අභ්‍යන්තර විගණක, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා. දැ.ගැ.ස.
8. සියළුම අංශ ප්‍රධානීන්, දිවිනැගුම දෙපාර්තමේන්තුව . - කා. දැ.ගැ.ස.